# අගක් මුලක් නැති කතා

බටහිර කෙටිකතාව හා නවකතාව පිළිබඳ ව, අද දවසේ විචාර කරන්නන් බටහිර ක්‍රමය හා බටහිර තම ගුරුවරුන් අනුගමනය කරමින් කළ යුත්තේ ඊනියා මනෝ විශ්ලේෂණාත්මක කියවීම් යැයි බොරු මනෝ විශ්ලේෂණාත්මක අදහස් පැතිරවීම නො වෙයි. ෆ්‍රොයිඩ්, ලකාන් වැන්නන් ඉදිරිපත් කළ ප්‍රවාද අඩු ම තරමින් පර්යේෂණයකට වත් භාජනය කළ හැකි දෑ නො වෙයි. මනස පිළිබඳ පර්යේෂණ කරන්නේ කෙසේ දැයි යමකු ඇසීමට ඉඩ ඇත. අඩු ම තරමින් ඊනියා මනෝ විශ්ලේෂණයේ ප්‍රවාදයක් උපකල්පනය කරමින් ඒ අනුව විවිධ පුද්ගලයන් හැසිරෙන ආකාරය පිළිබඳ නිරකෂණය කිරමක් කළ හැකි ද? පොපර් විද්වතා බටහිර විද්‍යාව ගැන කියන දේ අප නොපිළිගත්ත ද, ඊනියා විද්‍යාඥයෝ පිළිගනිති. ඔහු කියන්නේ මනෝ විශ්ලේෂණයෙහි ප්‍රවාද අසත්‍යකරණයට ලක් කිරමට නොහැකි බව ය. ඔහුට අනුව අසත්‍යකරණයට ලක් කිරමට නොහැකි දැනුම් පද්ධතියක් (බටහිර) විද්‍යාවක් විය නොහැකි ය.

පොපර් විද්වතාගේ මතය අප නො පිළිගැනීම එකකි. අප එය නො පිළිගන්නේ ඔහු කියන ආකාරයෙන් බටහිර විද්‍යාඥයන් ප්‍රවාද අසත්‍යකරණයෙහි යෙදී නො සිටින බැවිනි. අනෙක් අතට ප්‍රවාදයක් අසත්‍යකරණය යනු ප්‍රවාදයේ කිනම් කොටසක් අසත්‍ය කිරම ද ආදී ප්‍රශ්න ද පැනනගියි. එහෙත් බටහිර විද්‍යාඥයන්ට එවැනි කරුණු ප්‍රශ්න නො වෙයි. ඔවුහු බටහිර විද්‍යාව හා අනෙක් කෙෂ්ත්‍ර අතර ඇති වෙනස හඳුනාගැනීමට පොපරය නිර්ණායක යොදා ගනිති. ඒ අර්ථයෙන් බටහිර විද්‍යාඥයන්ට ඊනියා මනෝ විශ්ලේෂණය බටහිර විද්‍යාවක් නො වෙයි.

බටහිර විද්‍යාව හදාරා නැති විනිශ්චයකරුවකු කෙටි කතාවල හා නවකතාවල ඊනියා මනෝ විශ්ලේෂණාත්මක විචාර කරන්නේ තමන් බටහිරයන්ගෙන් ණයට ගෙන ඉදිරිපත් කරන පුහු මනෝ විශ්ලේෂණ බටහිර විද්‍යාඥයන් අතර නො පිළිගැනෙන බව වත් නොදැන විය හැකි ය. ඒ කෙසේ වෙතත් බටහිර නවකතාව හා කෙටිකතාව පරිණාමය වන ආකාරය අධ්‍යයනය කිරමේ දී තවදුරටත් ඊනියා මනෝ විශ්ලේෂණාත්මක කියැවීම්වලට බටහිර නවකතාවෙහි හා බටහිර කෙටිකතාවෙහි ඉඩක් නැති බව පෙනී යයි. අර විනිශ්චයකරුවා මහා ඉහළින් සලකන කුන්දේරා විද්වතාට බටහිර සාහිත්‍ය කෘතිවල පරිණාමය පිළිබඳව විනිශ්චයකරුවාට නැති හොඳ වැටහීමක් ඇති බව පැහැදිලි ය.

කුන්දේරා විද්වතාට අනුව බටහිර නවකතාවෙන් (හා කෙටිකතාවෙන්) විය යුත්තේ අනෙක් කෙෂ්ත්‍රයකින් නො වන දෙයකි. බටහිර නවකතාවෙන් සමාජ විශ්ලේෂණයක් පමණක් නො ව මනෝ විශ්ලේෂණයක් ද බලාපොරොත්තු නොවිය යුතු ය. එහෙත් අර විනිසුරුවරයා කුන්දේරා විද්වතා අගය කරමින් ම නවකතා හා කෙටිකතා සම්බන්ධයෙන් ඊනියා මනෝ විශ්ලේෂණාත්මක කියවීම් ද කරයි. අපට මෙහි දී වැදගත් වන්නේ බටහිර කෙටිකතාව එහි පරිණාමයෙන් ම අත් කරගෙන ඇති විශේෂ ගුණාංග ය.

අප කලින් සඳහන් කර ඇති ආකාරයට බටහිර කෙටිකතාව බටහිර නවකතාවෙන් ද ඒ දෙක ම වෙනත් සාහිත්‍යාංගවලින් ද, ඒ සියල්ල අනෙක් කලා කෘතීන්ගෙන් ද මතුපිටින් වෙන් වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය එලෙස මතුපිටින් වෙන් වීම හා වෙන් කිරම ආත්මීය කරගත්තේ වෙයි. කුන්දේරා විද්වතා බටහිර නවකතාවෙහි අනෙක් කෙෂ්ත්‍ර සියල්ලෙන් නො කියැවෙන දේ පමණක් අඩංගු විය යුතු ය යන ආකාරයේ ප්‍රකාශයක් කරන්නේ ඔහුට වත්මන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පරිණාමය පිළිබඳ යම් අවබෝධයක් ඇති බැවින් ය.

බටහිර කෙටිකතාවෙන් පණිවුඩ, ආදර්ශ ආදිය පිළිබඳ සවිඥානික හැඟවීමක් හෝ නො කෙරෙන බව පැහැදිලි ය. ඊනියා විචාරකයන් ද ඒ බව සනාථ කරන්නේ සාහිත්‍යයෙන් පණිවුඩ ඉවත් විය යුතු යැයි කියමින් ය. කෙටිකතාකරුවකු හෝ වෙනත් සාහිත්‍යකරුවකු හෝ කලාකරුවකු හෝ සමාජ ශෝධකයකු නො විය යුතු යැයි විචාරකයෝ කියති. අද කියැවෙන අදහස් අනුව බටහිර නවකතාවෙහි හා කෙටිකතාවෙහි කතා වස්තුවක් හෝ තිබීම අනවශ්‍ය ය. මුල, මැද, අග සහිත කතා අවශ්‍ය නැත යනුවෙන් කියැවෙන්නේ එය ය. අද ඇතැම් විචරකයන්ට අනුව නවකතාවෙහි හෝ කෙටිකතාවෙහි හෝ බැලිය යුත්තේ ඒ ප්‍රකාශ කර ඇති ආකාරය මිස වෙනත් දෙයක් නො වෙයි. එනම් ඔවුන්ට අනුව විචාරයෙහි දී සැලකිය යුත්තේ භාෂාව නිර්මාණාත්මක ව යොදාගෙන ඇති ආකාරය ය.

© Prof. Nalin De Silva

මෙහි දී මුල, මැද, අග සහිත කතා අවශ්‍ය නැත යන්න පිළිබඳ ව කරුණක් කිව යුතු ය. ඔනෑ ම සංස්කෘතියක එක් ක්‍ෂේත්‍රයක කියන කරන දෑ තවත් ක්‍ෂේත්‍රයක ද යම් ආකාරයකින් නිරූපණය වෙයි. අයින්ස්ටයිනීය කාලය පිළිබඳ අදහස විකෘති වීමක් මෙහි දී දැකිය හැකි ය. අයින්ස්ටයිනීය සාපේක්‍ෂතාවාදයට අනුව එක් එක් නිරීක්‍ෂකයාගේ කාලය පිළිබඳ මැනීම් වෙනස් වෙයි. සිද්ධි දෙකක් අතර කාල ප්‍රාන්තරය එක් නිරීක්‍ෂකයකුගෙන් තවත් නිරීක්‍ෂකයකුට වෙනස් විය හැකි ය. එහෙත් මෙහි දී කිසි විටෙකත් සිද්ධි කාලයෙහි පටිපාටිගත වීමෙහි වෙනසක් නො සිදුවෙයි.

උදාහරණයක් ලෙස ගත හොත් යම්කිසි නිරීක්‍ෂකයකුට සාපේක්‍ෂ ව A නම් සිද්ධිය B නම් සිද්ධියට පෙර සිදු වේ නම් එවිට වෙනත් ඔනෑ ම නිරීක්‍ෂකයකු සම්බන්ධයෙන් ද ඒ සිද්ධි පටිපාටිය එසේ ම වෙයි. වෙනත් වචනවලින් කියන්නේ නම් ඒ ඒ නිරීක්‍ෂකයාට සාපේක්‍ෂ වA නම් සිද්ධිය B නම් සිද්ධිය අතර කාල ප්‍රාන්තරය වෙනස් විය හැකි නමුත්A නම් සිද්ධිය කිසි විටෙකත් B නම් සිද්ධියට පසුව නො සිදුවෙයි. එක් නිරීක්‍ෂකයකුගේ මුල, මැද, අග පටිපාටිය වෙනත් නිරීක්‍ෂකයකු සම්බන්ධයෙන් ද වෙනස් නො වෙයි.

ක්වොන්ටම් යාන්ත්‍රිකයෙහි වුව ද එහි වෙනසක් නො සිදුවෙයි. මුල, මැද අග නැති වීමත් සමග හේතු ඵල සම්බන්ධයෙහි ද ප්‍රශ්න ඇති වෙයි. සාහිත්‍යයෙහි හා කලාවෙහි මුල, මැද, අග නැති කතා ගැන සඳහන් කිරමෙන් කියැවෙන්නේ එක් පැත්තකින් අයින්ස්ටයිනීය සාපේක්‍ෂකතාව විකෘති කිරමකි. අනෙක් පැත්තෙන් කරුණු ඉදිරිපත් කිරමේ දී නවකතාකරුවකුට හෝ වෙනත් සාහිත්‍යකරුවකුට හෝ කලාකරුවකුට ඇති නිදහස වරදවා වටහා ගැනීමකි. කතාවක් කීමෙහි දී මැද කොටස හෝ අග කොටස හෝ පළමුව කියා ඉන්පසු මුල කොටස කිව හැකි ය. එහෙත් එපමණකින් මුල, මැද, අග අතර ඇති හේතුව හා ඵලය අතර ඇති සම්බන්ධය හෝ සිංහල බෞද්ධයන්ට අනුව නම් හේතු ඵල සම්බන්ධය හෝ නැති නො වෙයි. මුල, මැද, අග නැති කතා යනුවෙන් හඳුන්වනු ලබන්නේ මේ හේතුව හා ඵලය අතර ඇති සම්බන්ධය තබා ගනිමින් කතාව ඉදිරිපත් කරන පටිපාටිය වෙනස් කිරමක් නම් එහි කියාපෑමට උත්සාහ කරන අන්දමේ විප්ලවීය වෙනසක් නැත. එසේ නො වේ නම් මුල, මැද, අග නැති කතා ගැන කතා කිරම අගක් මුලක් නැති වුවක් වෙයි.

ජාතක කතාවෙහි දළ ආකෘතිය එක් අර්ථයකින් ගත් කල මුල, මැද, අග පටිපාටිය නො සලකයි. සෑම ජාතක කතාවක ම පාහේ වර්තමාන කතාවක් හා අතීත කතාවක් වෙයි. එහි අතීත කතාව ඉදිරිපත් කෙරෙන්නේ වර්තමාන කතාවට පසුව ය. ජාතක කතා ආකෘතියෙහි වර්තමානයෙහි යම් සිද්ධියක් සිදු වෙයි. බුදුන් වහන්සේ ඒ සිද්ධිය සාකච්ඡා කර පෙර භවයක දී එවැනි දෑ සිදු වී ඇති බව දේශනා කර ඇත. එවිට අතීත කතාව වර්තමාන කතාවට පසුව ඉදිරිපත් වෙයි. අතීත කතාව දේශනා කර අවසානයේ දී පූර්වාපර සිද්ධි ගැලපීමක් කෙර හේතු ඵල සම්බන්ධය ද විදහා දැක්වෙයි.

පටිපාටිය හා සම්බන්ධ අර්ථයෙන් නො ව අග මුල නැති අර්ථයෙන් මුල, මැද, අග නැති කතා වර්තමානයෙහි බටහිර සාහිත්‍යයෙන් ඉදිරිපත් විය යුතු යැයි කීමෙන් ඉහත සඳහන් ආකාරයෙන් එවැනි සාහිත්‍ය කෘති හේතුව හා ඵලය අතර ඇති සම්බන්ධයෙන් මෙන් ම ජාතක කතාවෙන් ද වෙන් වෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා ජීවත් ව සිටි කාලයෙහි මුල, මැද, අග රහිත කතා ගැන අවධානයක් නො තිබිණි ය කියා ප්‍රශ්නයෙන් පැන යෑමට අපට නොහැකි ය. අපට අවශ්‍ය වී ඇත්තේ ජාතක කතාව හා කෙටි කතාව අතර ඇති සම්බන්ධතාවක් වේ දැයි දැන ගැනීම ය.

වත්මන් බටහිර සාහිත්‍යයෙහි අවධානය යොමු වන්නේ භාෂාව නිර්මාණාත්මක ව යොදා ගැනීමට ය. ඒ සිනමාවෙහි රූප රාමු නිර්මාණාත්මක ව යොදාගැනීම මෙනි. සමාජ විශ්ලේෂණය හෝ ඊනියා මනෝ විශ්ලේෂණ හෝ එහි දී වැදගත් නො වනවා පමණක් නො ව ඒ සඳහන් කිරමෙන් ද වැළකීම උසස් සාහිත්‍යකරුවකුගේ ලක්‍ෂණයක් වේ යැයි කියැවෙයි. වැඩිකල් නො ගොස් බටහිර සාහිත්‍යයෙහි චරිත විකාශනය ද අනවශ්‍ය වනු ඇත. එසේ වුවත් එක් කාලයක බටහිර සාහිත්‍යය චරිත විකාශනය ගැන ඒ සම්බන්ධ වූ හේතුව හා ඵලය අතර ඇති සම්බන්ධය ගැන අවධානය යොමු කෙළේ ඉන් පණිවුඩයක් නො දිය යුතු ය යන යන ස්ථාවරයෙහි පිහිටමින් ය. සාහිත්‍යයෙන් කළ යුත්තේ ඊනියා යථාර්ථය නිරූපණය වීම මිස සමාජය යහ මග යැවීම නො වේ ය යන්න මෙයින් කියැවිණි.

© Prof. Nalin De Silva

මෙය ජාතක කතාවෙහි අරමුණට හාත්පසින් ම වෙනස් වෙයි. ජාතක කතා දේශනා කෙර ඇත්තේ හා ඒ අනුසාරයෙන් පසුව ඒ ලියැවී ඇත්තේ හුදු චරිත විකාශන විදහා දැක්වීමට නො වෙයි. ජාතක කතාවලින් යම් සාහිත්‍යයික රසයක් නුපදින්නේ යැයි මෙයින් නො කියැවෙයි. එහෙත් කලින් සඳහන් කර ඇති පරිදි ජාතක කතා යනු හුදු කලා කෘති නො වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පෙර එවැනි හුදු කලා කෘති කිසි ම සංස්කෘතියක බිහි වී නැත. මනමේ නාට්‍යයෙහි මනමේ කුමරියගේ චරිතය විකාශනය වී ඇති ආකාරය වැදගත් විය හැකි නමුත් චුල්ල ධනුද්ධර ජාතකයෙහි වැදගත් වන්නේ රාගයේ ආදීනව පිළිබඳ යම පණිවුඩයක් දී සමාජය යහමගට යොමු කිරම ය. සිංහල බෞද්ධ සමාජයෙහි පුද්ගලයන් යහ මග යැවීම නිවන් මගකට යොමු කිරම හා බැදිණි.

කලා කෘතියක් සම්බන්ධයෙන් ඊනියා චරිත විකාශනය හෝ ඊනියා යථාර්ථයක් ගැන හෝ රස නිශ්පත්තියක් හෝ පමණක් ගැන කීමෙන් අද සිදු වී ඇත්තේ කුමක් ද? මෙරට අද ටෙලි නාට්‍යය නැරඹීම වඩාත් ම ජනප්‍රිය කලා වින්දනය ලෙස හැඳින්විය හැකි ය. අද එය ගීතය ඉක්මවා ජනප්‍රිය වී ඇතැ යි සිතිය හැකි ය. එහෙත් මේ ටෙලි නාට්‍යවලින් කෙරෙන්නේ කුමක් ද? බටහිර සාහිත්‍යකරුවන්, කලාකරුවන් හා විචාරකයන් කුමක් කීව ද සෑම කලා කෘතියකින් ම යම් පණිවුඩයක් සමාජයට ලැබෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි කෙටිකතාව අනෙක් කලා කෘතිවලින් වෙන් කෙරෙන්නේ මතුපිටින් ය. එහෙත් ඒ සියල්ල වෙනත් තලයක දී එකිනෙක හා බැඳෙයි. බටහිර බුද්ධිමතුන් තේරුම් නො ගන්නා ප්‍රධාන ම කරුණක් ද ඒ වෙයි. ඔවුන් වර්තමාන රාජ්‍යය අනාගමික (ඓහික secular) යැයි පවසන්නේ රාජ්‍යය ආගමින් වෙන් වී ඇත යන උපකල්පනයෙන් ය. වත්මන් සාහිත්‍යය ද එලෙස ම අනාගමික යැයි අපට කියා දෙන මෙරට සිටින අඟුටුමිට්ටි බුද්ධිමතුන් ද එසේ කියන්නේ සාහිත්‍යය එදා මෙන් නො ව අද ආගමෙන් වෙන් වී ඇත යන බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අදහස් මත පදනම් වෙමිනි. එහෙත් මේ සියල්ල යටින් එකිනෙක හා බැඳී ඇත. බටහිර අදහස් සිංහලෙන් කීම හැර වෙනත් කිසිවක් නො දත් මෙරට අඟුටුමිට්ටිටන් කුමක් කීව ද වත්මන් බටහිර සාහිත්‍යය ද ක්‍රිස්තියානි වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva